# නත්තල් තිළිණය



විශ්මි ගයේෂා

නත්තල් තිළිණය

විශ්මි ගයේෂා
7 ශ්‍රේණිය
මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර

පළමු දිගහැරීම
2025-02-08

ISBN 978-624-208-165-6

# පිදුම

අප විද්‍යාලයේ වර්තමාන විදුහල්පතිතුමිය ශෂිකලා
සේනාධීර මහත්මියඇතුළු විද්‍යාලයේ ගුරු
මැණිවරුන්ට සහ පියවරුන්ට,

මෙම ව්‍යාපෘතියේ මූලිකත්වය ගෙන කටයුතු කරන
සෙනෙවිරත්න මැතිතුමාටත්,
මාගේ දෙමාපියන්ට සහ උදව් කල සියලු දෙනාට හද
බැතියෙන් පුදමි.

# පෙර වදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් දස්කම් පෙන්වීම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීමට එහි විදුහල්පතිතුමිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් වේ. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

නෙතිනි කියන්නේ පුංචි ගැහැණු ළමයෙක්. මේ නත්තල් කාලය නිසා එයාගේ පවුලේ හැමෝම නත්තල් කාලයට ලෑස්ති වෙමිනුයි ඉන්නේ . නෙතිනිට නත්තල් තෑග්ග විදිහට ඕන වුනේ පුංචි ලස්සන බූල්පිරිච්ච බලු පැටියෙක්. නෙතිනි ඒ බලු පැටියව එයාගේ සුරතලා කරගන්න හරිම ආසාවෙනුයි හිටියේ. නෙතිනි හැමදාම ප්‍රාර්ථනා කලේ එයාට ඒ බලු පැටියා ලැබේවා කියලා. නෙතිනි එයාට ඒ බලු පැටියා ලැබෙයි කියලා කොච්චර බලාපොරොත්තු තියාගෙන හිටියාද කියනවානම් එයා ඒ බලු පැටියාට නමකුත් දාලයි තිබුණේ. ඒ තමයි 'සැලී'.

හැබැයි එයාගේ තාත්තා නම් කැමති වුනේ නෑ ඒ බලු පැටියව ගෙදර ගේන්න. මොකද කිව්වොත් තාත්තා හිතුවේ නෙතිනි බලු පැටියෙක් බලා ගන්න තරම් පොඩි වැඩියි කියලා. ඒත් එයාගේ අම්මයි ආච්චියි නම් එහෙම හිතුවේ නෑ. එයාලා විශ්වාස කළා නෙතිනිට බලු පැටියෙක් බලා ගන්න පුලුවන් කියලා.ඒත්

එයාලා තාත්තාට ඒ දේ තේරුම් කරලා දෙන්න හැදුවත් ඒකෙන් කිසිම වැඩක් උණේ නෑ.

ඒත් තාත්තා නෙතිනිට කවදාවත් බෑ කිවුවේ නෑ. හැබැයි තාත්තා නෙතිනිට බෑ නොකියා බෑ කිවුවා. “තාත්තේ ඔයා මට බලු පැටියෙක් ඇරගෙන දෙනවා නේද.” “ම්..ම්... ඒක නම් අම්මාගෙන් අහලා කියන්න වෙන්නේ. මට දැන් වැඩ ගොඩක් තියෙනවා.

ඔයා ගිහින් අම්මාට නත්තල් කේක් එක හදන්න උදවු කලොත් හොදයි පැටියෝ.” “හා හොදයි තාත්තේ.” දුකින් එහෙම කියන නෙතිනි එතනින් යනවා.

නත්තල් දවසට දවස් කිහිපයකට විතර කලින් අම්මයි තාත්තයි ආච්චියි එක තීරණයකට ආවා. ඊට පස්සේ තාත්තා ටික වෙලාවකින් ආයෙමත් ගෙදර ආවේ පෙට්ටියකුත් අතේ තියාගෙනයි.

“පැටියෝ මේ බලන්න මම ඔයාට මොකක්ද ගෙනාවේ කියලා.” “අනේ මොකක්ද තාත්තේ ඔයා මට ගෙනාවේ. ඉක්මනට පෙන්නන්නකො.” නංගියි නෙතිනියි ඇස් දල්වාගෙන බලාගෙන හිටියේ තාත්තා

නෙතිනිට ගෙනත් තියෙන්නේ මොකක්ද කියලා බලා ගන්නයි.

තාත්තා පෙට්ටිය බිමින් තිබ්බා. “ඔයාගේ බාප්පා රට ගියානේ. ඒ හින්දා එයාගේ බලු පැටියා බලා ගන්න කෙනෙක් ඕන කරලා තිබ්බෙ. ඒ හින්දා මම එයාව මෙහෙ ඇරගෙන ආවා.” “බාප්පාට බලු පැටියෙක් හිටියේ නෑනේ” නෙතිනි එහෙම කියනකොට නංගිත් ඒක අනුමත කරන්න ඔලුව හෙල්ලුවා. “නෑ, මේ එයාව ගෙනල්ලා වැඩි දවසක් නෑ.” “ආ එහෙමද. හරි.” “ඔයාට එයාව හොඳින් බලා ගන්න පුළුවන් උනොත්, ඔයාගේ නත්තල් තෑග්ග තමයි ඔයා බලාපොරොත්තුවෙන් ඉන්න බලු පැටියා.” “හුරේ... එහෙනම් මම මේ බලු පැටියාව හොඳට බලා ගන්නවා. තාත්තේ මට මේ බලු පැටියව ඉක්මනින් පෙන්නන්නකො. තාත්තා පෙට්ටිය ඇරියා. බලු පැටියා හිටියේ හරිම අපිරිසිදුවයි. බලු පැටියා හැමෝගෙම මූන දිහා බයෙන් වගේ බලාගෙන හිටියා. “තාත්තේ මෙයාගේ නම මොකක්ද.” “ආ..මේ..මෙයාගේ නම, මේ.. ආ පෝලි.” “ආ පෝලි හරි ලස්සන නමක්. මෙහෙට එන්න පෝලි.” නෙතිනි

බලු පැටියව අතට ගන්න හදනකොටම බලු පැටියා දුවන්න පටන් ගත්තා.

ගෙදර බඩු මුට්ටු පෙරලමින් බලු පැටියා හැමතැනම දිව්වා. කාටවත් එයාව අල්ලගන්න බැරි වුණා. අන්තිමටම එයා සෝෆා එක උඩට නැගලා සෝෆා එක හපන්න පටන් ගත්තා. “අනේ මගේ සෝෆා එක.” තරහින් කියපු අම්මා ඉක්මනින් ගිහිල්ලා බලු පැටියාව අතට ගත්තා.

බලු පැටියව අතට ගත්ත අම්මා එයාව නෙතිනිගේ අතට දුන්නා. “මම හිතන්නේ ඔක්කෝටම කලින් ඔයා නාලා හිටියොත් හොඳයි.” නෙතිනි බලු පැටියාට කිවුවා. ඊට පස්සේ එයා බලු පැටියව අරගෙන නාන කාමරයට දිවුවා. පෝලි නම් කැමති වුණේ නෑ නාන්න. එයා හයියෙන් බිරුවා.

නෙතිනි බලු පැටියාව නාවමින් ඉන්නකොට නංගියි ආච්චියි එතනින් ගියා. ඒ දෙන්නාට ඇහුණා නාන්න අකමැත්තෙන් කෑ ගහන බලු පැටියාගේ සද්දේ. “මොකක්ද අක්කා ඒ බලු පැටියාට කරන්නේ. පව් එයා.” එහෙම කියපු නංගි දොර ඇරියා. ආච්චි එපා

කියන්න හැදුවත් ඒ වෙනකොට නංගි දොර ඇරලා ඉවරයි. බලු පැටියා වේගෙන් එළියට දිවුවා.

නෙතිනිත් ඉක්මනට එයාගේ පස්සෙන් දිව්වා. බලු පැටියා වතුර හල හල මුළු ගේ වටේම දිවුවා. වතුර නිසා නෙතිනි ලිස්සලා ගිහිල්ලා අම්මාගෙ ඇගේ හැප්පුනා. අම්මගේ අතේ තිබුණු ක්‍රිස්මස් කුකීස් ටිකත් බිම වැටුණා. "අනේ මම අමාරුවෙන් හදපු ක්‍රිස්මස් කුකීස් ටික." අම්මා කීවා. "අනේ මට සමාවෙන්න අම්මේ." "කොහෙද ළමයෝ මේ හදිස්සියෙන් දුවන්නේ." "අනේ අම්මේ මම පෝලිව නාවනගමන් හිටියේ. එතකොට නංගි ඇවිල්ලා දොර ඇරියා. පෝලි එළියට දුවගෙන ආවා. මම මේ යන්නේ එයාව අල්ල ගන්න." නෙතිනි දුවන ගමන්ම කීවා.

බලු පැටියා දුවලා ගියේ උඩ තට්ටුවේ තියෙන නෙතිනිගේ කාමරයට. නෙතිනිත් ඒ පිටිපස්සෙන්ම වේගෙන් දුවලා ගියා. නෙතිනි කාමරයට යනකොට බලු පැටියා තෙත පිටින්ම එයාගේ පුටුව උඩ නිදාගෙන හිටියා. "අයියෝ.... පෝලි. දැන් මගේ පුටුව වේලන්නත් ඕනනේ. ඔයා නම් හරිම නරකයි පෝලි." බලු පැටියා අඬන්න වගේ නෙතිනි දිහා

බලාගෙන හිටියා. "හරි..හරි.. දැන් ඉතින් ඔහොම ඉන්නේ නැතුව මෙහෙට එන්න." නෙතිනිටත් දුක හිතිලා බලු පැටියාව අතට ගත්තා. ඊට පස්සේ නෙතිනි එයාව පිහදැමුවා. එතකොට නෙතිනිගේ ආච්චි ආවා කාමරයට. "ආ මේ ඉන්නේ බලු පැටියා හරි ලස්සනට." "අනේ ආච්චි බලන්නකෝ, මෙයා ඇවිල්ලා තෙත පිටින්ම මගේ පුටුව උඩ ඉද ගත්තා." "අනේ පැටියෝ, එයා තාම පුංචි බලු පැටියෙක්.මම ඔයාට මේ පුටුව වේලලා දෙන්නම්කෝ. නෙතිනි ඔලුව හෙල්ලුවා. ආච්චි කාමරයෙන් එලියට ගියා. "හොදයි පෝලි එහෙනම් මම ඔයාට නිදාගන්න තැනක් හදන්නම්කෝ." නෙතිනි එයාගේ පරණ රෙදි ටිකක් අරගෙන බලු පැටියාට නිදා ගන්න තැනක් හැදුවා. "ඔන්න පැටියෝ මම ඔයාට නිදාගන්න ලස්සන තැනක් හැදුවා. ලස්සනයිද කියලා බලන්න." නෙතිනි එහෙම කියලා පෝලි දිහා බලනකොට දැක්කේ, පෝලි එයාගේ අලුත්ම සපත්තු දෙක හපනවා. "අනේ පෝලි ඕක මගේ අලුත්ම සපත්තු දෙක. ඕක මෙහෙට දෙන්න." නෙතිනි බලු පැටියාගෙන් එයාගේ සපත්තු දෙක උදුර ගන්න

හැදුවා. නෙතිනි බලු පැටියාගේ කටින් සපත්තුව උදුර ගන්නකොට, සපත්තුවේ කෑල්ලක් ඉරුණා. එතකොට අම්මා ආවා කාමරයට. එතකොට අම්මා දැක්කා නෙතිනි දුකින් එයාගේ ඉරිච්ච සපත්තුවත් අතේ තියාගෙන ඉන්නවා. අම්මා ඇහුවා "ඇයි පැටියෝ ඔයා මේ දුකින් ඉන්නේ." කියලා. නෙතිනි එයාගේ අතේ තියාගෙන හිටපු සපත්තුව පෙන්නලා

කීවා, "මේ බලන්නකෝ අම්මේ පෝලි මගේ අලුත්ම සපත්තු දෙක ඉරුවා. මෙයා නම් හරිම නරක බලු පැටියෙක්." නෙතිනි හිටියේ හරිම දුකින්. "අනේ පැටියෝ එයා තාම පුංචි බලු පැටියෙක්නේ. මම හිතන්නේ එයාගේ දත් එනගමන් තියෙන්නේ. ඒකයි එයා හැමදෙයක්ම හපන්නේ."

නෙතිනි බලු පැටියා දිහා බලනකොට එයා ආයෙමත් නෙතිනිගේ සපත්තුවක් හපන්න පටන් ගෙනයි තිබුණේ. නෙතිනි ඉක්මනට ගිහිල්ලා බලු පැටියාගෙන් එක උදුර ගත්තා. "දැන් රෑ වෙලානේ. ඔයා නිදාගන්න පැටියෝ." අම්මා නෙතිනිට ෂීට් එක පෙරෙව්වා. "සුබ රාත්‍රියක් අම්මා." "සුබ රාත්‍රියක් පැටියෝ." අම්මා දොර වහගෙන එළියට ගියා.

නෙතිනි ඇස් පියාගන්න හදනකොටම බලු පැටියා නෙතිනිගේ ඇද උඩට ඇවිල්ලා. “පෝලි ඔයාට මේ ඇඳේ නිදා ගන්න බෑ. ඔයාට තැනක් තියෙනවනේ, ගිහිල්ලා එතන නිදා ගන්න.” බලු පැටියා දුකින් ආයෙමත් එයාගේ තැනට ගිහින් නිදා ගත්තා.

“මම එයාගේ හිත රිද්දුවාද මන්දා.” නෙතිනි හිතුවා. නෙතිනි බලු පැටියා ලගට ගිහිල්ලා “අනේ මට සමාවෙන්න පෝලි. මට තරහටයි එහෙම කියවුණේ.” කියලා කිවුවා. “සුබ රාත්‍රියක් පෝලි.” බලු පැටියාත් ඒකට ප්‍රතිචාර විදියට බිරුවා. නෙතිනි ඇදට ගිහිල්ලා නිදාගත්තා.

*      *      *      *

“පෝලි මේ බලන්න මම ඔයාට ලස්සන නිල් පාට කරපටියක් හැදුවා. ඔයා කැමතියිද මේකට.” බලු පැටියා සතුටින් බිරුවා. ඊට පස්සේ නෙතිනි ඒක පෝලිගේ බෙල්ලට දැම්මා. “එහෙනම් පැටියෝ අපි දැන් යමු එළියට ටිකක් ඇවිදින්න.” නෙතිනි බලු පෝලිත් එක්ක එළියට ගියා ඇවිදින්න. පෝලිගේ නහය උඩ සමනලයෙක් වහලා ඉදලා, එයා ආයෙමත් පියාබලා ගියා. බලු පැටියා බුරමින් සමනලයාගේ

පස්සෙන් එලවන්න පටන් ගත්තා. නෙතිනිවත් ඇදගෙනම බලු පැටියා දිවුවා. නෙතිනි වැටෙන්නත් ගියා. එතන එයාගේ යාලුවොත් සෙල්ලම් කරමිනුයි හිටියේ. "නෙතිනි එන්න අපිත් එක්ක සෙල්ලම් කරන්න." "අනේ මට දැන් සෙල්ලම් කරන්න බෑ." "අනේ ඇයි නෙතිනි එන්නකෝ අපිත් එක්ක සෙල්ලම් කරන්න." බලු පැටියා නෙතිනිව ඇදගෙන යනකොට නෙතිනි මුකුත් ම නොකියා බලු පැටියා පස්සෙන්ම ගියා. නෙතිනිට අද මොනවා වෙලාද දන්නේ නෑ. වෙනදාට නම් එයා සෙල්ලම් කරන්න එනවා. ඒත් අද එයා බලු පැටියෙක් පස්සෙන් දුවනවා." නෙතිනිගේ යාලුවෝ එයාගේ මේ වෙනස ගැන කථා වුණා.

ටිකකින් නෙතිනිට පුළුවන් වුණා බලු පැටියාව නතර කරගන්න.ඊට පස්සේ නෙතිනියි පෝලියි දෙන්නා ගෙදර යන්න පටන් ගත්තා. නෙතිනි ගෙදර යන ගමන් හිතුවා, "මම ඉස්සර නම් හරිම හොද ළමයෙක් මගේ යාළුවන්ට. ඒත් අද ඒ දේ වෙනස් වෙන්න ඇති. යාලුවෝ මගේ මේ වෙනස ගැන දුක් වෙන්න ඇති."

X

නෙතිනි ගෙදර ආවේ හරිම දුකින් වගේ. නෙතිනිව දැකලා අම්මා ඇහුවා, “ඇයි දැන් බලු පැටියා බලා ගන්න එක එපා වුණා ද?” “නෑ අම්මේ අද අපි දෙන්නා හොදට විනෝද වුණා.” නෙතිනි බලු පැටියත් එක්ක එයාගේ කාමරයට ගියා. “බලන්න පෝලි ඔයා අද කරපු දෙයින් යාලුවෝ මාත් එක්ක තරහා වෙන්න ඇති.” නෙතිනි දුකින් කිවුවා. පෝලිත් සමාව ඉල්ලන්න වගේ නෙතිනි දිහා බලාගෙන හිටියා. නෙතිනි බලු පැටියා දිහා බලලා කීවා, “කමක් නෑ. ඔයා තව ටික දවසක්නේ ඉන්නේ. ඊට පස්සේ මට සැලීව හම්බවෙනවා. මම දැන් යනවා මගේ තෑගි ටික පැක් කරන්න.”නෙතිනි එහෙම කියලා පල්ලෙහා තට්ටුවේ තියෙන නත්තල් ගහ ලගට ගියේ එයාගේ තෑගි ටික පැක් කරන්න.

නෙතිනි එයාගේ තෑගි ටික පැක් කරන්න පටන් ගත්තා. නෙතිනි එයාගේ යාලුවන්ගේ, පවුලේ අයගේ තෑගි ටික පැක් කරා. අන්තිමටම එයා පැක් කරේ එයාගේ ටීචර්ගේ තෑග්ග. එයා ටීචර්ට ඇරගෙන තිබුන

තැග්ග තමා, ලස්සන විදුරු කෝප්පයක්. ඉතින් නෙතිනි හරිම ආසාවෙන් ඒක පැක් කරන්න පටන් ගත්තා.

බලු පැටියා වේගෙන් දුවගෙන ආවා පල්ලෙහාට. දුවගෙන ආපු වේගෙට බලු පැටියා ගිහිල්ලා වැදුනා නෙතිනිගේ ඇගේ. නෙතිනිගේ අතින් වීදුරු කෝප්පය අතඇරුනා. වීදුරු කෝප්පය බිදෙන්නේ නැතිව බේරුනේ, ඒක ගිහිල්ලා වැටුනේ සෝෆා එක උඩට නිසා. නෙතිනිට තරහා ගියා. නෙතිනි බලු පැටියාට බනින්න පටන් ගත්තා. "බලන්නකෝ පෝලි ඔයා කරපු වැඩේ. බිමට වැටුණා නම් ඒක කුඩු වෙනවානේ." බලු පැටියා බයේ පැකිලෙමින් නත්තල් ගහ පිටිපස්සහ හැන්ගුනා. පවුලේ අනිත් අයත් ඉක්මනට ආවා මොකක්ද මේ කලබැගෑනිය කියලා බලන්න. ආච්චිට තේරුණා මොකක්ද මේ වෙලා තියන්නේ කියලා. ආච්චි කීවා, "දරුවෝ එයා තාම පොඩි පැටියෙක්. එයාට ඔහොම කෑ ගහන්න එපා." නෙතිනි සුසුමක් හෙලුවා. "අනේ මට සමාවෙන්න පෝලි. ආච්චි හරි. ඔයා තාම පොඩි පැටියෙක්. මට තරහා ගියපු නිසා එහෙම කියවුණේ."

බලූ පැටියා බයෙන් වගේ නෙතිනි ලගට ආවා. නෙතිනි බලූ පැටියාව එයාගේ අත් දෙකට ගත්තා.

තාත්තා නෙතිනි ලගට ආවා. “දුවේ මට ඔයාට දෙයක් කියන්න තියෙනවා. ඇත්තටම මේ ඔයාගේ බාප්පාගේ බලූ පැටියා නෙවෙයි. මේ පාරේ ඉන්න බලූ පැටියෙක්. අපි හිතුවේ ඔයාට මේ බලූ පැටියාව බලා ගන්නකොට, සැලීව ගන්නත් එපා වෙයි කියලා. මට සමාවෙන්න දුවේ.” නෙතිනි පුදුමයෙන් තාත්තා දිහා බලාගෙන හිටියා. නෙතිනිගේ අම්මා නෙතිනි ලගට ඇවිල්ලා කීවා, “ඔව් නෙතිනි. අපිට සමාවෙන්න. දැන් මේ හැම දෙයක්ම ඇති. අපි යමු නෙතිනි ඔයාගේ බලූ පැටියාව ගන්න.” පවුලේ හැමෝම කාර් ඒකට නැගලා යන්න පිටත් උනේ නෙතිනි ආසාවෙන් හිටපු බලූ පැටියා මිල දී ගන්න කඩයකටයි.

ටිකකින් හැමෝම කඩයට ආවා. එයාලා කඩයට යනකොට ඉතුරු වෙලා හිටියේ ඒ වර්ගයේ එකම එක බලූ පැටියයි. නෙතිනි කඩේට ගිහිල්ලා ඒ බලූ පැටියාව ඉල්ලුවා. එතකොට ම තවත් පුංචි ළමයෙක් ඇවිල්ලා ඒ බලූ පටියාවම ඉල්ලුවා.

මේ දෙන්නාට හරි ප්‍රශ්නයක් උනා කවුද මෙයාව ගෙදර ගෙනියන්නේ කියලා. අන්තිමටම නෙතිනි කීවා, “පැටියෝ ඔයා මෙයාව ගෙදර ගෙනියන්න.” කියලා. එතකොට අර පුංචි ළමයා ඇහුවා, “ඔයා ඔය ඇත්තමද කියන්නේ? එහෙනම් මම මෙයාව ගෙදර ගෙනියන්න ද?” නෙතිනි ඔලුව හෙල්ලුවා. එතකොට අම්මා පුදුමයෙන් ඇහුවා, “දුවේ ඔයාට හොඳටම විශ්වාසද?”. “ඔව් අම්මේ, මම හිතන්නේ මට ගැලපෙනම බලු පැටියා තමයි, පෝලි.” පෝලි සතුටින් බිරුවා.

ඊට පස්සේ හැමෝම සතුටින් ගෙදර ගියා. එදා ඉඳලා නෙතිනිගේ සුරතලා වුනේ පෝලි.

**නිමි.**

# පසු වදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාගයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛන්ඩව පාසල් පළාත්, කලාප, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකියි. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමගින් ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන්

ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.